## 2016 අංක 05 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත

1983 මැයි මස 01 වන දින සිට 2009 මැයි මස 18 වන දින දක්වා කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ඉඩම් ඇතුළු සිය නිශ්චල දේපළ ආපසු ලබාගැනීම සඳහා නඩු කටයුතු පැවරීමට නොහැකි වූ තැනැත්තන් සඳහා විශේෂ නෛතික විධිවිධාන සැලසීම පිණිස 2016 අංක 05 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත 2016 අප්‍රේල් මස බලාත්මක කරන ලදී.

පනත අනුව, ඉඩම් ඇතුළු යම් නිශ්චල දේපළක් සඳහා වලංගු නෛතික අයිතිවාසිකමක් ඇති යම් තැනැත්තෙකු (දේපළවල නීත්‍යානුකූල අයිතිකරු වශයෙන්) "අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු" වූයේ නම් (1983 මැයි මස 01 වන දිනයෙන් ආරම්භ වී 2009 මැයි මස 18 වන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී යම් සටන්කාමී ත්‍රස්තවාදී කණ්ඩායමක ක්‍රියාකාරකම් හේතුවෙන් පැවති අවස්ථානුගත කරුණුවල ප්‍රතිඵලයක් වශයෙන්, ඉඩම් ඇතුළු යම් නිශ්චල දේපළක් ආපසු ලබාගැනීම සඳහා අධිකරණයේ දී සිය අයිතිවාසිකම් ක්‍රියාත්මක කර ගැනීමට නොහැකි වූ තැනැත්තකු පනත අනුව "අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු" යන්නෙහි අර්ථ නිරූපණය කෙරේ.) කාලාවරෝධය හරහා හිමිකම්පාන වෙනත් යම් තැනැත්තකු විසින් එකී දේපළවල සන්තකය හෝ බුක්තිය දරමින් සිටිය ද, එසේ අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තාට ඔහුගේ/ඇයගේ දේපළවලට හිමිකම් ඉදිරිපත් කිරීම සිදුකළ හැකිය.

"අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකුට" පනතෙන් සලසන වාසිය, පනත ක්‍රියාත්මක කරන දින සිට වසර දෙකක කාලසීමාවක් ඇතුළත අත්කර ගැනීමට හිමිකම් තිබෙන බවට පනතේ 4 වන වගන්තියෙන් විධිවිධාන සලසයි. පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනය 2016 අප්‍රේල් මස 26 වන දිනය (කතානායකවරයාගේ සහතිකයේ සඳහන් දිනය වන,) වූ බැවින් පනත ක්‍රියාත්මක වීමට නියමිත කාලසීමාව 2018 අප්‍රේල් මස 26 වන දිනෙන් අවසන් වේ.

එබැවින් යම් තැනැත්තකු මෙම පනතේ විධිවිධාන යටතේ ඔහුගේ/ඇයගේ/ඔවුන්ගේ දේපළ ආපසු ලබාගැනීම පිණිස හිමිකම් ඉදිරිපත් කිරීමට කැමැත්තක් දක්වන්නේ නම්, එවැනි හිමිකම් ඉල්ලීම 2018 අප්‍රේල් මස 26 වන දිනට පෙරාතුව ඉදිරිපත් කළ යුතුය.

භාෂා තුනෙන්ම සකසන ලද පනතේ ඉලෙක්ට්‍රොනික පිටපත් අධිකරණ අමාත්‍යාංශයේ http://moj.gov.lk යන නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. මෙම පනතේ අන්තර්ගත කරුණු පිළිබඳව ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සාමාජිකයින් ද දැනුවත් කර ඇත. මෙම පනත ප්‍රකාර නීතිමය පියවර ගැනීමට කැමැත්තක් දක්වන තැනැත්තකු වේතොත්, ඔහුට/ඇයට අදාළ නීතිමය උපදෙස් ලබාගත හැකිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2016 අංක 5 දරන කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2016 අප්‍රේල් මස 26 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2016 අප්‍රේල් මස 29 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

9/15

ඉහත කී නිශ්චල දේපළේ සන්තකය දැරීම මගින්, එසේ සන්තකය දැරීම ප්‍රකාරව ඉඩම් ඇතුළු එම නිශ්චල දේපළට (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ 3 වන වගන්තියේ දැක්වෙන යම් අයිතිවාසිකමක් එම තැනැත්තාට ලැබෙන බවට සලකනු නොලැබිය යුතු ය.

*නිදර්ශන*

"ඒ" අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු වී සිටින කාලයේ "බී" විසින් "ඒ" ට අයත් ඉඩමේ සන්තකය දැරීම ආරම්භ කරනු ලබයි -"ඒ" අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු වී සිටින තාක් කල් "ඒ" ට එරෙහිව කාලාවරෝධය ආරම්භ නොවනු ඇත.

(2) (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ 13 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඉඩම් ඇතුළු නිශ්චල දේපළක් සඳහා හිමිකම් පාන යම් තැනැත්තකු හෝ එම තැනැත්තා හිමිකම් පාන්නේ කවුරුන් යටතේ ද, එම තැනැත්තා විසින් එකී ඉඩම ඇතුළු නිශ්චල දේපළ අවුරුදු තිහක කාලයක් සඳහා ප්‍රතිවිරුද්ධව සහ බාධාවකින් තොරව සන්තකය දැරීම මගින්, එසේ ප්‍රතිවිරුද්ධ සහ බාධාවකින් තොරව සන්තකය දැරූ බවට හිමිකම් පානු ලබන්නේ යම් තැනැත්තකුට එරෙහිව ද, එම තැනැත්තා අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු නම්, (68 වන අධිකාරය වූ) කාලාවරෝධ ආඥාපනතේ 3 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති ආකාරයට, එසේ සන්තකය දැරීම අවසානාත්මක සාක්ෂියක් ලෙස නොසැලකිය යුතු ය.

සැක දුරුකිරීම.

3. අවාසි සහගත තත්ත්වයට පත් වූ තැනැත්තකු මිය ගියහොත්, ඔහු එසේ අවාසි සහගත තත්ත්වයට පත්ව සිටි කාලසීමාව ඔහුගේ උරුමකාරයාගේ හෝ උරුමකාරයන්ගේ ප්‍රතිලාභයට එකතු විය යුතු අතර, ඒ අනුව මේ පනතේ 2 වන වගන්තිය යටතේ අවාසි සහගත තත්ත්වයකට පත් වූ තැනැත්තකුට ප්‍රදානය කරනු ලබන ප්‍රතිලාභ

10/15

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.